සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

10 ශ්‍රේණිය

# ඉස්ලාම් ධර්මය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 ඉස්ලාමීය විශ්වාසයන් සාරාංශගත දැක්වීම

(1) අකීදා (2) ඊමාන් (3) ඉබාදත් (4) අමල්

02 නබිවරු හා රසුල්වරු පෙන්වූ විශ්මිතයන්

(1) කරාමත් (2) මුඃජිසාත් (3) ඉස්මත් (4) සුහුෆ්

03 තම ක්‍රියා පිළිබඳ ස්වයං විමසුම

(1) මුසාබහා (2) මහාසබා (3) මුආනකා (4) මුෂාරකා

04 පොළොව සරුසාර කරන කාර්තව්‍යය

(1) සිරාඅත් (2) බරකත් (3) ඉමාරත් (4) කිලාෆත්

05 අවසාන අත්තහියියාත් අවස්ථාව

(1) සුජුද් (2) ඉඃතිදාල් (3) ඉෆ්තිරාෂ් (4) තවර්රුක්

06 සියලු ආශාවලින් තොර තපස් බව හඳුන්වන පදය

(1) සුහුද් (2) වරඋ (3) තව්බා (4) රියා

07 හාෆිල්වරු අධික ප්‍රමාණයක් ෂහීද් වූ යුද්ධය

(1) යර්මුක් (2) තබූක් (3) යමාමා (4) කෛබර්

08 අල්කුර්ආනය ආරක්ෂා කිරීමට අබුබක්ර් (රලි) තුමාට උපදෙස් දුන් සහාබිවරයා

(1) උස්මාන් (රලි) (2) සෛද් (රලි) (3) හුදෛෆා (රලි) (4) උමර් (රලි)

09 ඊමානයේ ප්‍රතිවිරුද්ධ අංශය

(1) තව්හීද් (2) කුෆ්ර් (3) ෂිර්ක් (4) අමල්

10 අත්තහාරත් යන්නෙහි අදහස

(1) පිරිසිදු ජලය (2) පිරිසිදුකම (3) පිරිසිදු ආහාර (4) ඉතා පිරිසිදු ජලය

11 අධි නජීසයේ අඩංගු වන්නේ,

(1) මත්පැන් (2) මල, ලේ (3) වමනය (4) සුනඛ රෝම

12 සලාතයේ එක් එක් රකාඅතයේ අනිවාර්යයෙන්ම පාරායනය කළයුතු සුරාව

(1) ෆාතිහා (2) ඉහ්ලාස් (3) නාස් (4) ෆලක්

13 ''උලුල් අස්මි'' නම් නබිවරුන්ගේ කෙනෙකි

(1) යුසුෆ් නබි (2) දාවුද් නබි (3) නුහ් නබි (4) ඉස්මාඉල් නබි

14 වහී මත්ලු මගින් ලබාගන්නා මූලාශ්‍රය

(1) අල්කුර්ආන් (2) හදීස් (3) ඉජ්මා (4) කියාස්

15 ස්තුතිය ප්‍රකාශ කිරීම සඳහා යොදාගන්නා පදය

(1) බාරකල්ලාහ් (2) ජසාකල්ලාහ්

(3) ෂුකුරල්ලාහ් (4) අල්හම්දුලිල්ලාහ්

16 මිනා, සෆා, මර්වා, මුස්දලිෆා යන ස්ථාන සම්බන්ධ ඉබාදතය

(1) හජ් (2) තවාෆ් (3) උම්රා (4) සජ්

17 ''මිනිසුන් අතර සුවිශේෂ තැනැත්තා'' වශයෙන් නබි(සල්) තුමාගේ ප්‍රශංසාවට ලක්වූයේ,

(1) මිනිසුන්ට ප්‍රයෝජනවත් තැනැත්තා (2) අධිකව දන් දෙන්නා

(3) පව් කමාව අයදින්නා (4) පිරිසිදුව සිටින්නා

18 වෛකල්පිත උපවාස සඳහා සුදුසු දිනයකි

(1) අයියාමුෂ් ෂක් (2) ආමුල් හුස්න් (3) අයියාමුත් තෂ්රික් (4) අයියාමුල් බීල්

19 සිකුරාදා මුස්ලිම් කෙනෙකු ජුම්ආවට සහභාගිවීමට පෙර ස්නානය කිරීම

(1) මක්රූන් (2) සුන්නත් (3) ෆර්ල් (4) වාජිබ්

20 යම් යහපත් ක්‍රියාවක් ජනයාගේ ගෞරවය බලාපොරොත්තුවෙන් කිරීම

(1) කුසල් ලබාදෙයි. (2) ප්‍රශංසවට ලක්වෙයි.

(3) ආදේශ කිරීමට සමානය. (4) ජනයාගේ ආදරය හිමිවේ.

21 මුස්ලිම්වරුන්ගේ පළමු කිබ්ලාව මස්ජිදුල් අක්සා පිහිටියේ

(1) මක්කාව (2) මදීනාව (3) බසරාව (4) ජෙරුසලම

22 ජමාඅත් සමග අනිවාර්යයෙන්ම ඉටුකළ යුතු සලාතය

(1) තරාවීහ් (2) ජනාසා (3) ඊද් සලාත් (4) ජුම්ආ

23 විශේෂිත කාලසීමාවක් නිර්දේශ කර ඇති පණිත

(1) අකීකා (2) උල්හීයා (3) තව්බා (4) කෆ්ෆාරා

24 210*l* අඩු ජල ප්‍රමාණය හඳුන්වනු ලබන්නේ,

(1) මාඋන් මුත්ලක් (2) මාඋන් කලීල්

(3) මාඋන් මුස්තඃමල් (4) මාඋන් නහුර්

25 ඊමාන් කළයුතු ප්‍රධාන කරුණු

(1) හයකි. (2) පහකි. (3) හතරකි. (4) තුනකි.

26 සලාතයේ දී සිදුවූ කිසියම් අමතකවීමක් වෙනුවෙන් ඉටුකරන්නේ,

(1) සජදා තිලාවත් (2) සජදා තෞබා (3) සජදා සහ්වු (4) සජදා ෂුකුර්

The National e-learning Portal for The General Education

27 සව්මය කඩකරන කරුණක් නොවන්නේ,

(1) අමතකවීමෙන් ජලය පානය කිරීම. (2) දිවා ආහාරය ගැනීම.

(3) වුවමනාවෙන් වමනය කිරීම. (4) සිහිසුන්වීම.

28 අයියාමුත් තෂ්රික් දින සහිත මාසය

(1) රබීඋල් අව්වල් (2) සෆර් (3) රමළාන් (4) දුල්හජ්

29 ඉස්ලාමීය අකීදාවේ අස්සම්මීයාත් හි අඩංගු අංගය

(1) අල්ලාහ් (2) මලාඉකා (3) කියාමා (4) රසූල්

30 ඉද්රීස් (අලෛ) හිමි සුහුෆ් සංඛ්‍යාව

(1) 110 කි. (2) 30 කි. (3) 50 කි. (4) 10 කි.

31 ෆර්ල් අයින් සඳහා නිදසුනකි

(1) සලාම් පැවසීම. (2) ආගමික වියතුන් බිහිකිරීම.

(3) රෝගීන්ගේ සුවදුක් විමසීම. (4) දෙමාපියන්ට සැලකීම.

32 පිවිතුරු චේතනාව හඳුන්වන අරාබි පදය

(1) ඉඛ්ලාස් (2) තක්වා (3) ඉන්සාන් (4) නීයියත්

33 ලොව දීර්ඝ කාලයක් සිරගත කර තිබිය යුතු බවට හදීසයේ සඳහන් වන අවයවය

(1) ඇස (2) කට (3) අත (4) පය

34 ගින්නෙන් දර කැබලි විනාශ වන්නාසේ යහපත් ක්‍රියා විනාශ කරන ගුණාංගය

(1) උඩඟුකම (2) අහංකාරය (3) ඊර්ෂ්‍යාව (4) බොරුව

35 ආරම්භක තක්බීර්වලින් පසු පාරායනය කරනුයේ,

(1) දුආඋල් ඉෆ්තිතාහ් (2) තක්බීර් තහ්රීමා

(3) කුනූත් (4) සූරා ෆාතිහා

36 ඊමාන් හා අමල් බෙදා වෙන්කළ නොහැකි බව සඳහන් සූරාව

(1) සූරා ලුක්මාන් (2) සූරා අස්ර් (3) සූරා ෆුර්කාන් (4) සූරා ඉඛ්ලාස්

37 ආශාවන්ට පොළඹවන මිනිසාගේ සිත

(1) නෆ්ස් ලව්වාමා (2) නෆ්ස් මුතමඉන්නා

(3) නෆ්ස් බිස්සුඃ (4) නෆ්ස් අම්මාරා

38 අස්මාඋල් හුස්නාවලින් එකක් වූ අල් මුඃති යනු

(1) ආරක්ෂකයා (2) බලන්නා (3) අසන්නා (4) ලබාදෙන්නා

39 හයියා අලස්සලාත් යන්නෙහි තේරුම

(1) නැමදුම ආරම්භ වි ඇත. (2) ජය ලැබීමට හනික එන්න.

(3) නැමදුමට හනික එන්න. (4) නැමදුම නින්දට වඩා අගනේය.

40 ජාමිඋල් කුර්ආන් විරුදාවලිය ලද සහාබිවරයා

(ල. 40)

(1) අබුබක්ර් (රලි) (2) උමර් (රලි) (3) උස්මාන් (රලි) (4) අලි (රලි)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. තෝරාගත් තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01 (1) මුඃමින් යනු කවුරුන් ද?

(2) අන්නුබුව්වත් කොටසට ඇතුළත් අංග කවරේ ද?

(3) ආගම් හා සුහුෆ් හිමි නබිවරයා කවුරුන් ද?

(4) අල්කුර්ආනයේ සූරාවන් වර්ග කවරේ ද?

(5) ඉබාදත් යන්නට අර්ථයන් 2 ක් ලියන්න.

(6) ජබීරත් යනු කුමක් ද?

(7) සලාතය ඉටුනොකරන්නා කියාමාවේ නැගිටවනුලබන්නේ කවුරුන් සමගද?

(8) තක්බීර් තහ්රිමා යනු කුමක් ද?

(9) රුකූඋ හා සුජුද්හී පාරායනා ලියා දක්වන්න.

(10) මෙලොව හා පරලොව හඳුන්වන අරාබි පදයන් ලියා දක්වන්න. ( 2 x 10 = 20)

02 (1) අකීදා කලාවේ ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරන්න. (ල. 02)

(2) අකීදාවේ අන්තර්ගත කරුණු පෙළගස්වන්න. (ල. 03)

(3) අකීදාවේ පිවිතුරු බව රැකීමට කටයුතු කළ ඉමාම්වරු නම් කරන්න. (ල. 05)

03 (1) මුඃමින්වරයෙකුගේ ක්‍රියාකාරීත්වයට ඇතුළත් විය යුතු කොන්දේසි 2 ක් ලියන්න.(ල. 02)

(2) මුඃමින්වරයෙකු ඊමාන් ඇතිව කළයුතු අමල් ක්‍රියාවන් 6 ක් සඳහන් කරන්න. (ල. 03)

(3) ආගම් හා සුහුෆ් පහළ කරන ලද නබිවරු වෙන් වෙන්ව නම් කරන්න. ( ල. 05)

04 (1) ඉබාදත්හි කොටස් නම් කරන්න. (ල. 02)

(2) ඉබාදත්හි මූලික අරමුණු 3 ක ලියන්න. (ල. 03)

(3) ලෞකික ක්‍රියා ඉබාදත්වීමට අවශ්‍ය කොන්දේසි සඳහන් කරන්න. (ල. 05)

05 (1) මුජාහදතුන් නෆ්ස් යනු කුමක් ද? (ල. 02)

(2) අල්කුර්ආනයේ සඳහන් යහගැත්තෙකුගේ යහ ගුණාංග 6 ක් සඳහන් කරන්න. (ල. 03)

(3) දන්දීමෙන් ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න. (ල. 05)

06 (1) ආධ්‍යාත්මික දියුණුව උදෙසා ඉස්ලාමීය මඟපෙන්වීම් 4 ක් නම් කරන්න. (ල. 02)